# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2041/8 – 2017 ඔක්තෝබර් 16 වැනි සඳුදා – 2017.10.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2017 අංක 257 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/11/2016/යූඩීඒ/31.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:
ජේ/ඩීඑස්/2/9/4/13-2015.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2017 ඔක්තෝබර් මස 10 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, යාපනය.

2. **ඉඩමේ විස්තරය.–** උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, J 81 කොටුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, යාපනය නගරය, කොට්ඨාස අංක 1 (කොටුව) යාපනය මහනගර සභා සීමාව තුළ ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක වයිජ්/ජේඑෆ්එෆ්/2016/114 හා 2016.09.21 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – තාන්ඩිකුලම්කරෙයි අයිග්නුර්ට්ටුවන්වයල් වරම්පු වරම්පු කඩයියන්ඩිතිඩල්, වරි. අංක 66, කන්දප්පසේගරම් පාර – ප්‍රමාණය: හෙක්. 0.0580**

උතුරට: අන්ජුතේවන්කුලම්, ඒ. ෂම්මුගනාදන්ගේ උරුමකරුවන් සහ සීමාසහිත යාපනය පාම් සංවර්ධන සමූපකාර සමිතිය හිමිකම් කියන අයිග්නුර්ට්ටුවන් වයල්; නැගෙනහිරට: සීමාසහිත යාපනය පාම් සංවර්ධන සුමූපකාර සමිතිය හිමිකම් කියන අයිග්නුර්ට්ටුවන් වයල් සහ කැබලි අක්ෂර බී; දකුණට: කැබලි අක්ෂර බී සහ බිම් කානුව; බටහිරට: බිම් කානුව සහ අන්ජුතේවන්කුලම්.

02. **කැබලි අක්ෂර 'බී' – තාන්ඩිකුලම්කරෙයි අයිග්නුර්ට්ටුවන්වයල් වරම්පු කඩයියන්ඩිතිඩල්, වරි. අංක 72, කන්දප්පසේගරම් පාර – ප්‍රමාණය: හෙක්. 0.0403**

උතුරට: කැබලි අක්ෂර ඒ සහ සීමාසහිත යාපනය පාම් සංවර්ධන සමූපකාර සමිතිය හිමිකම් කියන අයිග්නුර්ට්ටුවන් වයල්; නැගෙනහිරට: සීමාසහිත යාපනය පාම් සංවර්ධන සමූපකාර සමිතිය නඩරාජා සහ හිමිකම්



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කියන අය නොදන්නා අයිග්නුර්ට්ටුවන් වයල්; දකුණට: හිමිකම් කියන අය නොදන්නා අයිග්නුර්ට්ටුවන් වයල් සහ බිම් කාණුව; බටහිරට: බිම් කාණුව සහ කැබලි අක්ෂර ඒ.

03. **කැබලි අක්ෂර 'සී' – මුත්තවේලි වඩක්කු වයල්, වරි. අංක 78, මුන්නේෂ්වරම් වීදිය – ප්‍රමාණය: හෙක්. 0.0763**

උතුරට: රොබින් තම්පු හිමිකම් කියන මුත්තවේලි වඩක්කු වයල් සහ බිම් කාණුව; නැගෙනහිරට: බිම් කාණුව සහ මුන්නේෂ්වරම් වීදිය; දකුණට: මුන්නේෂ්වරම් වීදිය සහ කැබලි අක්ෂර ඩී; බටහිරට: කැබලි අක්ෂර ඩී සහ රොබින් තම්පු හිමිකම් කියන මුත්තවේලි වඩක්කු වයල්.

04. **කැබලි අක්ෂර 'ඩී' – මුත්තවේලි වඩක්කු වයල්, වරි. අංක නොදන්නා මුන්නේෂ්වරම් වීදිය – ප්‍රමාණය: හෙක්. 0.0812**

උතුරට: රොබින් තම්පු හිමිකම් කියන මුත්තවේලි වඩක්කු වයල් සහ කැබලි අක්ෂර සී; නැගෙනහිරට: කැබලි අක්ෂර සී සහ මුන්නේෂ්වරම් වීදිය; දකුණට: මුන්නේෂ්වරම් වීදිය සහ යාපනය මහනගර සභාව සතු දේපල; බටහිරට: යාපනය මහනගර සභාව සතු දේපල, රොබින් තම්පු හිමිකම් කියන මුත්තවේලි වඩක්කු වයල්.

11 - 53

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.